රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
**Ministry of Public Administration and Management**

මගේ අංකය / எனது இல. / My No. ES/F/60 - II

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2017.07. 14

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ,
දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ,
ශ්‍රී ලංකා තාක්ෂණ (කලින් ම.ම.කා.සේවය) සේවයේ,
නිලධාරීන් සේවයේ යොදවන සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත,

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම - සීමිත (2016/2017).**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2017.07.07 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් ඉංජිනේරු සහකාරවරුන් (කලින් කාර්මික සහකාර) හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරණ නිලධාරීන් හෝ අනෙකුත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් පත්වීම් බලධාරියා විසින් අනුමත කරනු ලැබූ සුදුසුකම් ලත් කාර්මික නිලධාරීන්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 2027 හා 2017.07.07 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනය, අංක 2028 හා 2017.07.14 දිනැති ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කර ඇති බව කාරුණිකව දන්වමි.

02. එමඟින් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2017.08.11** දක්වා දීර්ඝ කර ඇති බවත්, අදාළ අයදුම්පත්‍රය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් (www.pubad.gov.lk) බාගත හැකි බවත් වැඩිදුරටත් දන්වමි.

03. ඒ අනුව අවශ්‍ය කටයුතු කරන්නේ නම් මැනවි.

**ඕ.වී.මාපටුනගේ,**
සහකාර අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය

අත්/කලේ : **ජේ.ජේ.රත්නසිරි,**
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
ලිපිනය / முகவரி / Address: නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 - ශ්‍රී ලංකාව / சுதந்திர சதுக்கம், கொழும்பு 07 - இலங்கை. / Independence Square, Colombo 07 - Sri Lanka.
වෙබ් අඩවිය / இணையத்தளம் / Website - www.pubad.gov.lk